---

**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධනිතකර නොතිබුණු රු.2,158,538 ක් වටිනා විදුලි සෝපානය සමාලෝචිත වර්ෂයේ ජ"නල් සටහන් 2 හා 3 මගින් දෙවරක් ප්‍රාග්ධනිත කර තිබීම නිසා ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද ට්‍රැක්ටර් දෙකෙහි වටිනාකම වූ රු.2,578,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද ත්‍රීරෝද රථය තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ උපදේශක සේවා වියදම වු රු.505,197 ක මුදල ප්‍රතිපූරණය කර නොගතයුතු වුවත්, ලැබියයුතු රජයේ ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) රු.54,150,606 ක ස්ථාවර තැන්පතු මුදල් ආපසු ගැනීම සමුච්චිත අරමුදල හරකර මුලධන ආධාර ලැබීම් බැර කිරීම හේතුවෙන් ආදායම් හා වියදම් ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කෙරුණි.

(ඊ) එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘති 112 ක් වෙනුවෙන් 10% අත රැඳවුම් මුදල රු.10,910,826 ක් වෙනුවෙන් ණයගැති වෙන්කිරීමක් කර නොතිබුණි.

---

(උ) ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.15,850,576 ක් වුවත්, ගිණුම් වල රු.15,391,082 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඌ) මහජන බැංකුවේ ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා 2012 දෙසැම්බර් 24 දින රු.2,500,000 ක චෙක්පතක් ලියා තිබූ අතර, ගිණුම්වල මෙම මුදල ආයෝජන වශයෙන් දක්වා තිබුණි.

(එ) මහජන බැංකුවේ ඇති ස්ථාවර තැන්පතු රු.30,000,000 ක මුදල 2013 ජනවාරි 01 දිනට කල් පිරෙන අතර 2012 වර්ෂයට අදාළ ලැබියයුතු පොලිය රු.1,121,918 ක් ස්ථාවර තැන්පතුවට එකතුකර ආයෝජන ලෙස දක්වා තිබුණි.

(ඒ) වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලිය රු.5,163,736 ක් වුවත්, රු6,065,372 ක් ලෙස ගිණුම්වලට ගෙන තිබුණි. ඒ අනුව රු.901,636 කින් ස්ථාවර තැන්පත් පොලී අදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) පසුගිය වර්ෂය සඳහා හිඟහිටි ස්ථාවර තැන්පතු පොලිය රු.2,003,515 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබීම හිඟහිටි පොලී ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ඕ) 2012 දෙසැම්බර් 31 දනට හිඟ හිටි පොලිය රු.1,443,822 ක් වුවත්, රු.2,749,788 ක් වශයෙන් ගිණුමට ගෙන තිබීම නිසා එම ගිණුම රු.1,305,966 කින් වැඩියෙන් දැක්වුණි.

(ක) ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් වෙනුවෙන් දරන ලද රු.857,144 ක මුදල විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික ගිණුමට හර කිරීම නිසා එම ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මෙම මුදලින් රු.593,144 ක ප්‍රමාණයක් ඉකුත් වර්ෂයට අදාල වන හෙයින් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ඉවත්කර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. මේ නිසා ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ ගිණුම රු.1,450,288 කින් අඩුවෙන්ද සමුච්චිත අරමුදල රු.593,144 කින් අඩුවෙන්ද දැක්වුණි.

(ග) එකතු කළ අගය මත බදු ගිණුමේ නිමවුම් බද්දෙන් රු.1,139,439 ක හිලව් කරන ලද බදු මුදල අඩුකළයුතු වුවත්, අඩු නොකිරීම නිසා එම ගිණුම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 02 කට අදාළව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.317,281,795 ක්වූ අතර, ඒවාට අදාළ උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.307,638,446 ක් විය. ඒ අනුව රු.9,643,349 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම්**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.33,256,184 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිපලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 65,848,894 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,506,754 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාළව සභාපතිවරයා විසින් ඉදිරිපත්කර තිබූ ඇසතමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදයම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 20,987 | 22,511 | 8,347 |
| (ii) | බදු කුලී | 2,237 | 1,876 | 526 |
| (iii) | වෙනත් ආදායම් | 1,610 | 815 | 1,363 |

2.2.2 **වරිපනම් බදු**

මාබෝදල, උඩුගම්පොල හා මිනුවන්ගොඩ උපකාර්යාලවල 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂවල එකතුව රු.8,350,944 ක් වු අතර, එහි වසර 1 සිට 5 දක්වා හිඟ ශේෂය රු.5,051,847 ක් විය.

2.2.3 <u>වෙනත් ආදායම්</u>

(අ) උඩුගම්පොල උප කාර්යාලයේ 2004 වසරේ සිට අයවීමට ඇති හිඟ බදු කුලී ශේෂය රු.52,376 ක් වූ අතර, 2007 සහ 2008 වර්ෂවල සිට හිඟහිට ඇති කඩකුලී ශේෂය රු.42,550 ක් විය.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 උනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාර අවම වශයෙන් වසර 5කට වරක්වත් කඩ කුලිය තක්සේරු කළයුතු වුවද, කඩ සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3 <u>ආර්ථිකමය නොවූ ගනුදෙනු</u>

ලංකා බැංකු ජංගම ගිණුමේ වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා රුපියල් මිලියන 10 සිට රුපියල් මිලියන 66 දක්වා මුදල් ප්‍රමාණයක්ද ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුමේ රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 15 දක්වා මුදල් ප්‍රමාණයක්ද පැවති අතර, මෙම මුදල් සඟාවට ඉහළ ආදායමක් ලැබෙන පරිදි ස්ථාවර තැන්පතුවල හෝ සත්දින ඇමතුම්වල ආයෝජන කිරීමට කටයුතු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ආදායම් පරිපාලනය